# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2025.02.28 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2025 පෙබරවාරි මාසයේ දී ද සෘණ අගයක් වාර්තා කළේය

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2025 ජනවාරි | 2025 පෙබරවාරි |
|---|---|---|
| දර්ශක අගය | 192.6 | 192.2 |
| මාසික වෙනස (%) | 0.5 | -0.2 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | -4.0 | -4.2 |

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද කෙටි කාලීන උද්ධමන පුරෝකථන හා අනුකූලව, අඛණ්ඩව හයවන මාසයටත් සෘණ අගයක පවතිමින් 2025 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 4.0ක අවධමනයට සාපේක්ෂව 2025 පෙබරවාරි මාසයේ දී සියයට 4.2ක අවධමනයක් වාර්තා කළේය.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර නොවන කාණ්ඩයෙහි අවධමනය, 2025 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 4.7හි සිට 2025 පෙබරවාරි මාසයේ දී සියයට 6.1 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර කාණ්ඩයෙහි අවධමනය 2025 ජනවාරි මාසයේ දී පෙන්නුම් කළ සියයට 2.6හි සිට 2025 පෙබරවාරි මාසයේ දී සියයට 0.2 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය**




මාසික පදනම මත මනිනු ලබන කො. පා. මි. දර්ශකය 2025 පෙබරවාරි මාසයේ දී සියයට 0.21ක පහළ යෑමක් වාර්තා කළේය. මේ සඳහා, ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.11ක මිල ඉහළ යෑමේ සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.32ක මිල පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතු විය. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2025 ජනවාරි මාසයේ පැවති සියයට 1.2හි සිට 2025 පෙබරවාරි මාසයේ දී සියයට 0.7ක් දක්වා තවදුරටත් පහළ ගියේය.

දැනට පවතින අවධමන තත්ත්වය ඉදිරි මාස කිහිපය තුළ දී ද පවතිනු ඇති බව පුරෝකථන මගින් පෙන්නුම් කරයි. කෙසේ වුවද, ඉන් අනතුරුව, උද්ධමනය ධන අගයකට පත්වී, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව ඉලක්කගත සියයට 5ක මට්ටමට ක්‍රමයෙන් ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**
**2025 ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ.

ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට හා බලශක්ති උත්පාදනයට සිදුවන බලපෑම; සිදු විය හැකි වැටුප් ඉහළ යෑම හේතුවෙන් ඇතිවන්නාවූ ඉල්ලුම් තත්ත්වයේ බලපෑම; අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව; නුදුරු කාලීනව පැවතිය හැකි අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයුමට අදාළ අවහිරතා; ඉහළ මට්ටම්වලින් රුපියල අවප්‍රමාණය වීමට ඇති හැකියාව; භූ-දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල කෙරෙහි ඇති විය හැකි ඉහළ පීඩනය; සහ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති වෙනස්කම් හේතුවෙන් ගෝලීය උද්ධමනය පහළ යෑම සඳහා ඇතිවිය හැකි අවහිරතා වැනි සාධක මගින් උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකුවිට, අනෙකුත් සාධක අතර, බලශක්ති මිල ගණන් අඩු කිරීම මගින් ඇති විය හැකි වක්‍ර බලපෑම්; අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල සිදු විය හැකි මිල අඩු කිරීම්; සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම ඇතුළත් වේ.

***මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන***

(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.



[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2024 | පෙබරවාරි | 200.6 | 177.2 | 0.0 | 0.6 | 5.9 | 2.8 | 11.3 | 8.5 |
| | මාර්තු | 196.7 | 177.3 | -1.9 | 0.1 | 0.9 | 3.1 | 8.0 | 6.1 |
| | අප්‍රේල් | 195.2 | 177.3 | -0.8 | 0.0 | 1.5 | 3.4 | 5.7 | 4.4 |
| | මැයි | 194.1 | 177.0 | -0.6 | -0.2 | 0.9 | 3.5 | 3.9 | 3.3 |
| | ජූනි | 195.6 | 177.4 | 0.8 | 0.2 | 1.7 | 4.4 | 3.1 | 2.8 |
| | ජූලි | 194.7 | 177.9 | -0.5 | 0.3 | 2.4 | 4.4 | 2.8 | 2.7 |
| | අගෝස්තු | 191.1 | 177.3 | -1.8 | -0.3 | 0.5 | 3.6 | 2.5 | 2.7 |
| | සැප්තැම්බර් | 190.9 | 177.6 | -0.1 | 0.2 | -0.5 | 3.3 | 2.4 | 2.8 |
| | ඔක්තෝබර් | 189.9 | 177.5 | -0.5 | -0.1 | -0.8 | 3.0 | 2.2 | 2.9 |
| | නොවැම්බර් | 189.4 | 177.1 | -0.3 | -0.2 | -2.1 | 2.7 | 1.7 | 3.1 |
| | දෙසැම්බර් | 191.7 | 177.1 | 1.2 | 0.0 | -1.7 | 2.7 | 1.2 | 3.3 |
| 2025 | ජනවාරි | 192.6 | 178.4 | 0.5 | 0.7 | -4.0 | 1.2 | 0.4 | 3.2 |
| | පෙබරවාරි | 192.2 | 178.5 | -0.2 | 0.1 | -4.2 | 0.7 | -0.5 | 3.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.